www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වෙනිසියුලානු සහ ඉක්වදෝර ජනසතු කිරීම්වල ඇති වැදගත්කම

## The significance of Venezuela's and Ecuador's nationalizations

**බිල් වැන් ඕකන් විසිනි**
**2007 ජනවාරි 18**

පසු ගිය සතිය පුරා වෙනිසියුලාවේ සහ ඉක්වදෝරයේ පැවැති ජනාධිපති පදවිප්‍රාප්තීන් "සමාජවාදය" සහ "විප්ලවය" සඳහා කෙරුනු කැඳවුම්වලින් සනිටුහන් කෙරින.

ජනවාරි 10 කරකස් නුවර පැවැති දිවුරුම් දීමේ උත්සවයේ දී, යලිත් වරක් වෙනිසියුලාවේ ජනාධිපතිවරයා බවට තේරී පත්වූ හියුගෝ චාවේස්, 1991 දී පෞද්ගලීකරනය කරන ලද රටේ ජාතික විදුලි සන්දේශ සමාගම වන සීඒඑන්ටීවීය සහ බල ශක්ති කර්මාන්තය ජනසතු කිරීමට සැලසුම් කර ඇති බව නිවේදනය කලේ ය. ඒ සමගම රටේ තෙල් නිධිවල රාජ්‍ය පාලනය දැඩි කිරීමට සැලසුම් කර ඇති බව ද ඔහු ප්‍රකාශ කලේ ය.

"පෞද්ගලීකරනය වූ සියල්ල ජනසතුකරනය සඳහා ඉඩ හැරිය යුතුය" චාවේස් ප්‍රකාශ කලේ ය. "අපි සමාජවාදී මාවතේ ඉදිරියට ගමන් කරමින් සිටිමු. කිසි දෙයකට හෝ කිසිවෙකුට හෝ එය වැලැක්විය නොහැකිය". ප්‍රසිද්ධ කතාවේ එක් තැනකකදී ඔහු මෙසේ ද එකතු කලේ ය. "මම (ලියොන්) ට්‍රොට්ස්කිගේ මාවතේ දැඩි ලෙස සිටිමි. එනම් නොනවතින විප්ලවයයි."

ඉක්වදෝරයේ, රෆායෙල් කොරයා ජනවාරි 15 දින උත්සවාකාරයෙන් වැඩ බාර ගත්තේ ය. මෙහි දීල ඔහු "රැඩිකල් විප්ලවයක්" ආරම්භ කිරීම සඳහා ඇති සැලසුම් නිවේදනය කල අතරල කලාපය පුරා වෙලාගනිමින් පවතින "නව සමාජවාදය" සඳහා තමාගේ ඇති විශ්වාසය ප්‍රකාශ කලේය. ඉක්වදෝරය මිරිකමින් ඇති විදේශ නය ගෙවීම සීමා කරන බවටත් විදේශ තෙල් කොන්ත්‍රාත් ගැන යලි සාකච්ඡා කරන බවටත් ඔහු තර්ජනය කලේය. මන්තාවල පිහිටා ඇති එක්සත් ජනපද ගුවන් හමුදා කඳවුර වසා දැමීමට ද ඔහු තර්ජනය කර ඇත.

චාවේස්ල බ්‍රසිලියානු ජනාධිපති ලුයිස් ඉනසියෝ ලූලා ද සිල්වාල නිකරගුවාවේ ඩැනියල් ඔර්ටේගා (දින කිහිපයට පෙරාතුව පදවි ප්‍රාප්ත වූ සැන්දිනිස්තා නායකයා), බොලීවියාවේ ඒවෝ මොරාලෙස් සහ ඉරානයේ මහ්මුඩ් අහමඩිනිජාඩ් ඇතුලු රාජ්‍ය නායකයින් 17කගේ සභාවක් අමතමින් කොරයා ප්‍රකාශ කලේ, "පුරවැසියන්ගේ විප්ලවය යන්තම් ආරම්භ වූවා පමනි, මෙය කිසිවකට හෝ කිසි කෙනෙකුට හෝ නැවැත්විය නොහැකි ය." යනුවෙනි.

සගයන් සොයමින් ඉරාන ජනාධිපතිවරයා කලාපයේ සිදු කරන ලද සංචාරය සමග ඒකාබද්ධ වූ වොෂින්ටනය හෙලා දකින රැඩිකල් සහ "සමාජවාදී" පූර්වචානම්වලින් සමන්විත පදවි ප්‍රාප්තීන් මාලාව මගින් ලතින් ඇමරිකාවේ "වමට හැරීමක්" පෙන්නුම් කෙරෙන සංවේගවාදී මාධ්‍ය ආවරනයක නව රැල්ලක් එක්සත් ජනපදය තුල ජනිත කෙරින.

කොරයාගේ පූර්වගාමියෙකු වූ හිටපු ඉක්වදෝර හමුදා කර්නල් ලුසියෝ ගුටිරෙස් කොරයාට යම් දුරකට සමාන වූ වේදිකාවක් මත 2002 දී ජනාධිපති ධුරයට පත් වූ විට එය ද මෙවැනි හැරීමක් ලෙස සලකනු ලැබූ ආකාරය ගැන අවධානය යොමු කිරීම වැදගත් වෙයි. තම රාජකාරියේ යම්තම් වසර දෙකක් ගෙවී යත් ම ජනාධිපති මාලිගාවෙන් ඔහු පලවා හරිනු ලැබුවේ තමන් විසින් ක්‍රියාත්මක කරන ලද දක්ශිනාංශික ආර්ථික ප්‍රතිපත්තීන්ල වොෂින්ටනය වැලැඳ ගැනීම සහ තම රජයේ පැතිර පැවති දූෂනය හේතුවෙන් ඇවිලී ගිය මහජන විරෝධතා මගිනි.

"නව ජනසතු කිරීම්" පිලිබඳ චාවේස්ගේ නිවේදනය කර්කස් හි කොටස් වෙලඳපොල තුල වාර්තා ගත වැටීමකට තුඩු දුනි. සීඒඑන්ටීවීය කර්කස් හි කොටස් වෙලඳපොල තුල විශාලතම ප්‍රසිද්ධ වානිජ්‍ය සමාගම පමනක් නොව වෝල් ස්ට්‍රීට්හි වෙනිසියුලාවට සම්බන්ධ කොටස් විකිනීම පවත්වාගෙන යන්නා ද වෙයි.

නිසැකව ම, පරිපූර්න පෞද්ගලීකරනයේ සහ නිදහස් වෙලඳ ප්‍රතිපත්තීන් හි ඊනියා "වොෂින්ටන් ඒකමතියේ" මොඩලය විසින් සිදු කෙරෙනු ආර්ථික හා සමාජ ව්‍යසනයෙන් මුදා හැරුනු පසු ගිය සතියේ සිදුවීම් ලතින් ඇමරිකාව තුල සිදුවෙමින් පවත්නා දේශපාලන හැරීම සනාථ කරයි. මෙය තව දුරටත් ගැඹුරු වූයේ යුරෝපයේ සහ ආසියාවේ තම ප්‍රතිමල්ලයන්ට

සාපේක්ෂව එක්සත් ජනපදයේ ධනවාදයේ සාපේක්ෂ ආර්ථික පසු බැසීමත් මැද පෙරදිග තුල තම හමුදා වික්‍රමයන්හි බරපතල ලෙස හිරවී සිටීම මත් හේතුවෙනි.

මෙහි ප්‍රතිඵලය වූයේ, සාම්ප්‍රදායික දක්ෂිනාංශික පක්ෂවලට පරාජයන් අත් වීමත්, වෙනිසියුලාව හා ඉක්වදෝරය පමනක් නොව බොලීවියාව, බ්‍රසීලය, චිලිය, පේරු, උරුගුවේ, ආර්ජන්ටිනාව හා නිකරගුවා වැනි රටවල ඓතිහාසිකව "වාම" යනුවෙන් අනන්‍යව සිටි හෝ තමන් එසේ යයි තමන් ම හඳුන්වාගත් අපේක්ෂකයින් ජයග්‍රහනය කිරීම ය.

වෙනස් දේශපාලන මූලයන් සහිත, ප්‍රතිපත්ති ගැන පුලුල් ව නො එකගතා ඇති මෙම ආන්ඩු, ඒ හෝ මේ ආකාරයෙන් "නව ලිබරල්වාදය" හෙලා දැකීමේත් එක්සත් ජනපද ප්‍රතිපත්තිය විවේචනය කිරීමේත් යෙදී සිටිති. ඔවුහු මහාද්වීපය පුරා පැතිර පවත්නා දැවැන්ත සමාජ අසමානතාවය කෙරෙහි ඇති වූ මහජන වෛරයට ආමන්ත්‍රනය කරන අතර සමාජයේ ඉතාමත් දිලිඳු ස්තරයන් හි සහය දිනා ගැනීමට සීමිත සමාජ සහනාධාර වැඩ පිලිවෙලක් බොහෝ අවස්ථාවල ආරම්භ කර ඇත.

එම මොහොතෙහි ම, "21 වන සියවසේ සමාජවාදය" තෙක් මාවත පෙන්වන බවට චාවෙස් සහ කොරයා වැන්වූන්ගේ ප්‍රකාශ තිබියදී වුව, මෙම ආන්ඩු ජාත්‍යන්තර මූල්‍ය ආයතනයන්හි පොදු නියමයන්ට බැඳුනු ධනපති පෞද්ගලික දේපොල විශ්වීය ලෙස ආරක්ෂා කර ඇති අතර තමන් මෙහෙයවන රාජ්‍යවල සම්ප්‍රදායික හමුදා හා මර්දනකාරී බලකායන් නිරුපද්‍රතව නඩත්තු කර ඇත.

බොහෝ අර්ථයන්ගෙන් ගත් කල, හිටපු පැරටෲප් භටයකු, ලුතිනන් කර්නල්වරයකු හා කුමන්ත්‍රන නායකයකු වූ චාවෙස් විසින් තොරොම්බල් කරනු ලබන ප්‍රතිපත්ති නියෝජනය කරන්නේ සමාජවාදයේ පුනර්ජීවනයක සලකුනු නොව ආර්ජන්ටිනාවේ ජුවාන් පෙරෝන් හෝ පසු කාලයක පැනමාවේ ජෙනරාල් ඔමාර් ටොරිජෝස් සහ පේරු හි ජෙනරාල් ජුවාන් වෙලස්කුවෙස් අල්වරාඩෝ වැන්නවුන් සමග අනන්‍ය වූ ආර්ථික ජාතිකවාදය හා මිලිටරි ජනතාවාදය වැනි දැවල දෝංකාරයකි.

නව වෙනිසියුලානු "ජනසතු කිරීම්" සම්බන්ධයෙන් ගත් කල එය කෙන්ද කන්ද කිරීමකි. වෙනිසියුලාව මාන බලමින් සිටින "මූලෝපායික අංශයන්හි තම හිමිකම යලි ලබා ගැනීම්" ආශ්‍රිත දෙයක් ලෙස චාවෙස් විසින් තම යෝජනා ඉදිරිපත් කරන නමුදු, රාජ්‍ය පවරා ගැනීම් සම්බන්ධිත යථා ඉලක්කයන් සාපේක්ෂ වශයෙන් ඉතා අඩු වැදගත්කමක් දරයි.

සීඒඑන්ටීවී කෙසේවත් දුරකථන ඒකාධිකාරයක් නොවේ. මෙම සමාගම විසින් ජනගහනයෙන් සියයට 11 කට රැහැන් දුරකථන මාර්ග සපයනු ලැබ ඇති අතර, එහි ජංගම දුරකථන අංශය වන මොවිල්නෙට් විසින් මෙම වඩාත් පුලුල් සහ ලාභදායී ජංගම දුරකථන වෙලඳපොලෙහි පාලනය කෙරෙන ප්‍රමානය යන්තම් සියයට 35 ක් පමනකි.

සීඒඑන්ටීවීහි විශාලතම කොටස් හිමිකරු වන්නේ සියයට 28.5 කොටස් සහිත එක්සත් ජනපදය පදනම් කරගත් වෙරිසොන් සංනිවේදන සංයුක්ත නීතිගත සමාගමයි. ලතින් ඇමරිකානු විදුලි-සංදේශ වෙලඳ පොලෙහි සැලකිය යුතු පංගුවක් අත්කරගත් ටෙල්මෙක්ස් සමාගමේ හිමිකරු වන මෙක්සිකානු බිලියනපතියකු වන කාලොස් ස්ලිම් වෙත තම කොටස අලෙවි කිරීම සඳහා වෙරිසොන් සමාගම පසු ගිය අප්‍රේල් මස ආරම්භකත්වයක් ගත්තේ ය.

ටෙල්මෙක්ස් සමාගම ස්පාඤ්ඤයේ ටෙලෙෆෝනිකා සමග උග්‍ර තරගයකට මුහුන දී ඇත. මෙම ටෙලෙෆෝනිකා සමාගම සීඒඑන්ටීවී හි කුඩා කොටස් හිමියකු වන නමුදු වෙනිසියුලාවේ ජංගම දුරකථන වෙලඳපොලෙහි සියයට 48 හිමි කරගෙන ඇති මොවිස්ටාර් නම් වූ තමාගේම සමාගමක් පාලනය කරයි. පාර්ශ්වීය වශයෙන් ජනසතුකරනයේ අරමුන වන්නේ තම ප්‍රධාන තරගකරුවාගෙන් ස්පාඤ්ඤ ටෙලෙෆෝනිකා සමාගම ආරක්ෂා කරමින් එයට වැඩි වාසි සැලසෙන සේ කාලොස් ස්ලිම් සමග ඇති ගනුදෙනුව කඩාකප්පල් කිරීමේ ප්‍රයත්නයක් බවට අනුමානයක් පවතී.

සීඒඑන්ටීවී පවරා ගැනීම පිටුපස තවත් උත්සුකයක් වන්නේ රටේ විශාලතම ගනුදෙනු කරන සමාගම වෙලඳපොලෙන් ඉවත් කිරීම ය. කරකස් නුවර (බොලිවාර්ස් මුදලින්) ද වෝල් වීදියේ (ඩොලර්වලින් ද ) යන දෙකෙහිම ගනුදෙනු කෙරෙන සමාගමේ කොටස් වෙනිසියුලා මූල්‍යාධිපතීන්ට රටින් ප්‍රාග්ධනය පිට කිරීමටත් ඩොලර් සංචිත ආකාරයෙන් තම වත්කම් පරිවර්තනය කිරීමටත් මාධ්‍යයක් ලෙස දායක වී ඇත. මෙය රටේ ප්‍රාග්ධනය පිට මං කිරීමට ත් රටේ උද්ධමනය සියයට 18 කින් ඉහල යාමටත් තුඩු දුනි.

රජයට පවරා ගැනෙන විදුලි බල අංශයන්හි වැඩිමනත් ප්‍රමානයක් දැනටමත් රාජ්‍ය සමාගම් දෙකක් සතුව ඇත. යම් බලපෑමකට ලක් විය හැකි පෞද්ගලීකරනයට ලක්වූ ප්‍රධාන සමාගම වන ඉලෙක්ට්‍රිසිඩෑඩ් ඩි කර්කස් සමාගම එක්සත් ජනපදය පදනම්කරගත් ඒඊඑස් සමාගම මගින් පාලනය කෙරෙයි.

## කොටස් හිමියන්ට සම්පූර්න වන්දි

වෙනිසියුලාවේ තෙල් ආදායමින් එකතු කරගන්නා ලද රාජ්‍ය සතු මුදල්වලින්, රජය යටතට පවරා ගනු ලබන බලශක්ති සමාගම්වලට මෙන්ම සීඒඑන්ටීවී කොටස් හිමියන්ට මුලුමනින් ම වන්දි ගෙවන බව ආන්ඩුවේ නිලධරය පැහැදිලි කර ඇත. "තම කොටස් සඳහා හොඳ මිලක් කොටස් හිමියන්ට ලැබෙනු ඇත"

යනුවෙන් මුදල් ඇමති රොඩ්‍රිගෝ කබෙසාස් වෙනිසියුලානු දිනපතා පුවත් පතක්වන එල් යුනිවර්සල් ට පැවසීය.

වෙනිසියුලානු ආර්ථිකයේ සත්‍ය ලෙස ම මූලෝපායික අංශයක් වන තෙල් සහ ස්වාභාවික ගෑස් සම්පත් සැලකූ කල චාවේස් ආන්ඩුවේ අපේක්ශිත ජනසතු කිරීම් අවම වශයෙන් ආර්ජන්ටිනාවේ පෙරොන් හා මෙක්සිකෝවේ කාර්ඩෙනාස් වැන්නවුන්ගේ ධනපති ජාතික ආන්ඩු විසින් පෙර වකවානුවකදී ක්‍රියාවේ යෙදවූ ජනසතු කිරීම් වැන්නක් පවා නොවන බව පැහැදිලි ය.

වෙනිසියුලාව ලෝකයේ පස්වන විශාලතම තෙල් අපනයන කරුවා ය. තෙල් බැරල් බිලියන 78ක ප්‍රත්‍යක්ෂ සංචිතයක් මෙන්ම බර තෙල් බහුල සංචිතයක් පවතින ඔරිනොකො තෙල් වාටියේ එය සතුව බැරල් ට්‍රිලියන 1.2ක් තරම් විශාල ඇස්තමේන්තු ගත ප්‍රමානයක් ඇත. වෙනිසියුලාවේ තෙල් නිෂ්පාදනයෙන් සියයට 60 ක් ම එක්සත් ජනපදය ගිල දමයි.

තෙල් කර්මාන්තයේ චාවෙස් ගේ ආරම්භකත්වය, බොලිවියාවේ ජනාධිපති එවො මොරාලෙස් විසින් එහි ස්වාභාවික ගෑස් නිධි පිලිබඳ ප්‍රකාශ කරන ලද " ජනසතු කිරීම්" සමග බොහෝ සමානතා පවතී. එනමුත්, තෙල් බිම්වලට හමුදා යැවීමේ නාටකාකාර බලපෑමෙන් චාවේස් වලකින බවක් පෙනෙයි. කෙටියෙන් කිවහොත්, මෙය වනාහි, (වෙනිසියුලා) රජය සතු පීඩීවීඑස්ඒ සඳහා කෙරෙන තෙල් නිෂ්පාදනයෙන් බහුතර කොටසක් ද ඔවුන්ගේ බද්ධ ව්‍යාපාර මගින් උපයා ගන්නා ලාභයෙන් වඩා විශාල කොටසක් ද ලබා ගනු වස්, ඔරිනොකො තෙල් වාටියේ ක්‍රියාත්මක වන බහු ජාතික බලශක්ති සමාගම් -- එක්සොන්මොබිල්, කොනොකො, චෙව්රන් සහ ප්‍රන්ස ටොටල් සමාගම -- සමග ගනුදෙනුවක් ඇති කර ගැනීමට දරන ප්‍රයත්නයකි.

අති මහත් ලාභ උල්පතක් වන වෙනිසියුලා තෙල් නිධි මත තම අධිකාරය පවත්වා ගැනීම සඳහා -යම් අඩුවීමක් සිදු වුව ද- මෙවැනි සාකච්ඡාවලට එකඟ වීමට එක්සත් ජනපදයේ පදනම් සහිත බලශක්ති යෝධයින් බලාපොරොත්තු වෙති.

රටේ තෙල් පිලිබඳ ඇමති රෆායෙල් රමිරෙස්, සඳුදා පැහැදිලි කලේ පෞද්ගලික ආයෝජන සහ ගවේශන සඳහා මෙම අංශය විවෘත කෙරුනු විට 1999 දී චාවෙස් ආන්ඩුව විසින් අත්සන් කරන ලද ස්වභාවික ගෑස් කොන්ත්‍රාත්තු වෙනස් කිරීමට ආන්ඩුව අදහස් නොකරන බව ය.

"21 වන සියවසේ සමාජවාදය" සහ "නොනවතින විප්ලවය" පිලිබඳ චාවේස්ගේ ප්‍රකාශයන් වෝල් වීදියේ ප්‍රධාන මූල්‍ය මධ්‍යස්ථාන විසින් අබැටකට වඩා ගනන් නොගැනින.

"වෙනිසියුලාවේ පෞද්ගලික අංශය නැති කර දැමීමට චාවේස් අදහස් කරන බවක් අපට තවම නොදැනෙයි. සීඒඑන්ටීවී සහ අනෙකුත් රාජ්‍ය ආයතන ජනසතුකරනය සංකේතාත්මකව වැදගත් වෙයි", යනුවෙන් ජේපී මෝගන් පවසයි.

ඒ සමගම "පෞද්ගලික දේපොල මුලුමනින්ම අහෝසි කිරීමක් අපට නොපෙනේ" යනුවෙන් මෙරිල් ලින්ච් ප්‍රකාශ කලේය.

පසු කී දෙය අඩු තක්සේරුවකි. පසු ගිය වසර පුරා වෙනිසියුලාවේ පෞද්ගලික අංශය, රාජ්‍ය අංශයේ වර්ධන වේගය දෙගුනයකින් ඉක්මවා, එනම් සියයට 10.3 වේගයකින් වර්ධනය වී ඇත. මෙම කාලය තුල දී රටේ නිෂ්පාදන අංශයේ වර්ධනය සිදු වූයේ ගනන් නොගත යුතු තරමින් වන අතර නිල විරැකියා රේට්ටුව දල වශයෙන් සියයට 10 ක් විය.

ප්‍රධාන වර්ධනය සිදු වී ඇත්තේ ලෝකයේ වඩාත් ලාභදායී කොන්දේසි භුක්ති විඳින ස්ථාන අතර පවත්නා වෙනිසියුලාවේ මූල්‍යමය අංශයේ ය. පසු ගිය අගෝස්තු මස ෆිනෑන්ෂල් ටයිම්ස් පුවත් පත උපහාසාත්මකව සටහන් කලේ, "විප්ලව කාල පරිච්ඡේදයන්හි තුවක්කුකරුවන් ට මුහුන දීමට සම්ප්‍රදායිකව බැංකුකරුවන්ට සිදු විය. නමුත් වෙනිසියුලාවේ දි නම් ඔවුහු සාදයක් පවත්වති" යනුවෙනි.

ලිපිය මෙසේ තවදුරටත් විස්තර කලේ ය, "බැංකු ජනසතු කිරිම වෙනුවට, තෙල් මුදල්වල "විප්ලවවාදී" බෙදා හැරීම මගින්, ධනවත් පුද්ගලයින් ජනනය කෙරිනු අතර ඔවුහු කරකස් නුවර ස්විට්සර්ලන්ත සහ අනෙකුත් ජාත්‍යන්තර බැංකුකරුවන් වශීකරන කාන්දමක් බවට පත් කරමින් සිටිති. තවද එය පුද්ගලික බැංකුකරුන් විප්ලවය සඳහා කල තැන්පතුවක් නොවේ.

පුවත් පත සටහන් කලේ 2005 දී වෙනිසියුලාවේ බැංකු වත්කම් ඩොලර් බිලියන 29.3 සිට 39.8 දක්වා තුනෙන් පංගුවකින් වැඩි වූ බවය.

වෙනත් අර්ථයකින් ගතහොත් ප්‍රසාරනය වෙමින් පවතින තෙල් ආදායම්වලින් චාවේස්ට ක්‍රියාත්මක කිරීමට හැකි වී තිබෙන සුභසාධන වැඩ පිලිවෙලවල් තිබියදී ම, වෙනිසියුලා ආර්ථිකයේ පාලන බලය රඳා ඇත්තේ ජාත්‍යන්තර සහ දේශීය මූල්‍ය ප්‍රාග්ධනය පාලනය යටතේ ය.

තම ආන්ඩුවේ වර්ධනය වෙමින් පවතින බොනපාට් ස්වභාවය, වෙනිසියුලා සමාජය තවමත් වෙලාගෙන සිටින ධනවත්බව සහ දුගීබව අතර ඇති අති මහත් සමාජ බෙදීම පිලිබිඹු කරයි. මාස 18ක් පුරා අඥාවෙන් රට පාලනය කිරීමට ඔහුට ඉඩ ලබා දීම අන්තර්ගතව තම නව නිල කාලය සඳහා චාවේස් ඉදිරිපත් කරන ලද යෝජනාවලින් මෙම බොනපාට් ස්වභාවය පෙන්නුම් කරයි.

තම අධිරාජ්‍ය විරෝධී පූර්වාදර්ශ හා බැඳුනු, සීමිත ව පවතින චාවේස්ගේ සමාජ පියවරයන් වොෂින්ටනයේ කෝපය අවුලුවාලයි. පසු ගිය සතියේ කොන්ග්‍රස් මන්ඩලය ඉදිරියේ "භූගෝලීය තර්ජන" ගැන සාක්ෂ්‍ය දෙමින්, ජාතික ආරක්ෂක අධ්‍යක්ෂ ජෝන් නෙග්‍රොපොන්ටෙ විස්තර කලේ චාවේස් ආන්ඩුව " ප්‍රජාතන්ත්‍රවාදය" සඳහා තර්ජනයක් බව ය.

2002 දී, මෙම තර්ජනයට දක්ෂිනාංශ කුමන්ත්‍රනයක් අවුලවමින් වොෂින්ටනය විසින් දැක්වූ ප්‍රතිචාරය වෙනිසියුලා කම්කරුවන්ගේ සහ දුගීන්ගේ මහජන විරෝධය හේතුවෙන් ව්‍යර්ථ විය. චාවේස් ආන්ඩුව පෙරලීම පිනිස තවත් ප්‍රයත්නයක් සඳහා සීඅයිඒ ය සැලසුම් කරමින් සිටින බව නිශ්චිත ය.

පොතක පිට කවරයෙහි මුද්‍රනය කර ඇති වචනවලට වඩා යම් දෙයක් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලවය න්‍යාය ගැන හියුගෝ චාවෙස් දන්නේ දැයි නොදනිමු. ඒ කෙසේ වෙතත්, මෙහි කේන්ද්‍රීය ඉදිරි දර්ශනය සමස්තයක් ලෙස වෙනිසියුලාවට මෙන්ම ලතින් ඇමරිකාවට ම වලංගු වෙයි.

රැඩිකලීකරනය වූ හමුදා නිලධරය ඇතුලුව, ධනේශ්වරය හෝ එහි නියෝජිත කන්ඩායමක් හෝ මෙහෙයවනු ලබන ජාතික විප්ලවයක පදනම මත අධිරාජ්‍යවාදයේ වියගහෙන් විමුක්ත වීමට මෙම රටවලට නොහැකි ය. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගත හැක්කේ ධනවාදය පෙරලාදැමීම සඳහා ජාත්‍යන්තර විප්ලවවාදී පන්තියේ කොටසක් ලෙස කම්කරු පන්තිය ස්වාධීනව දේශපාලනිකව බලමුලු ගැන්වීම මගින් පමනි.

© www.wsws.org